# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.09.19 පැය 0630 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/1767/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |

**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,**
**අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,**
**සියළුම මාධ්‍ය ආයතන.**

**<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු ජනමාධ්‍ය වෙත යොමු කිරීම.</u>**

### 01. මනුෂ්‍ය ඝාතනයක් - මීරිගම පොලිස් වසම.

2025.09.18 වන දින සවස් කාලයේ මීරිගම පොලිස් වසමේ රේන්දපොල, මීරිගම ප්‍රදේශයේ පදිංචි පුද්ගලයෙකු විසින් තම බිරිදට තියුණු ආයුධයකින් පහරදී ඝාතනය කල බවට සඳහන් කරමින් මීරිගම පොලිස් ස්ථානයට පැමිණ භාරවීමෙන් පසු අත්අඩංගුවට ගෙන විමර්ශන අරම්භ ඇත.

**මරණකාරිය වයස අවුරුදු 33 ක් වූ රේන්දපොල ප්‍රදේශයේ පදිංචිකාරියෙකි.**

මරණකාරිය සමඟ ඇති කරගත් පවුල් ආරවුලක් හේතුවෙන් මෙම ඝාතනය සිදුකර ඇති බවට දැනට සිදුකරන ලද විමර්ශනයේදී අනාවරණය වී ඇති අතර මෘත ශරීරය වතුපිටිවල රොහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. මීරිගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

### 02. සැකකටයුතු මරණයක් - දෙහිවල පොලිස් වසම.

2025.09.18 වන දින උදෑසන කාලයේ දෙහිවල පොලිස් වසමේ අල්විස් පෙදෙස, දෙහිවල ප්‍රදේශයේ නිවසක් පිටුපස පුද්ගලයෙකු මියගොස් ඇති බවට දෙහිවල පොලිස් ස්ථානයට ලද පනිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු විදෙස් ජාතිකයෙකු වන අතර අනන්‍යතාව මෙතෙක් තහවුරුවී නොමැත.**

මෘත ශරීරය තිබූ ස්ථානයට යාබදව නිවාස සංකීර්ණයක් තිබී ඇති අතර එහි චීන ජාතිකයින් හා මියන්මාර් ජාතිකයින් පිරිසක් පදිංචිව සිට ඇති බවට විමර්ශන වලදි අනාවරණය වී ඇත. මහෙස්ත්‍රාත් පරීක්ෂණයෙන් පසු මෘත ශරීරය කළුබෝවිල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර දෙහිවල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 03. විදුලිසැර වැදී පුද්ගලයෙකු මියයාමක් - වෙල්ලාවලි පොලිස් වසම.

2025.09.18 වන දින උදෑසන කාලයේ වෙල්ලාවලි පොලිස් වසමේ කන්නපුරම්, නැගෙනහිර ප්‍රදේශයේ නිවසකදී පුද්ගලයෙකුට විදුලිසැර වැදී බරපතල තත්ත්වයෙන් කළුවංචිකුඩි රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මියගොස් ඇති බවට වෙල්ලාවලි පොලිස් ස්ථානයට ලද පනිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 41 ක් වූ තුරනිලාවනි ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය කළුවංචිකුඩි රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර වෙල්ලාවලි පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 04. දුම්රියේ ගැටී පුද්ගලයෙකු මියයාමක් - පොලොන්නරුව පොලිස් වසම.

2025.09.18 වන දින උදෑසන කාලයේ පොලොන්නරුව පොලිස් වසමේ කදුරුවෙල දුම්රියපල ආසන්නයේදී මඩකලපුව සිට කොළඹ දක්වා ධාවනය වූ දුම්රියේ ගැටී පුද්ගලයෙකු මියගොස් ඇති බවට පොලොන්නරුව පොලිසියට ලද තොරතුරක් මත විමර්ශන ආරම්භකර ඇත.

**මරණකරු වයස අවුරුදු 70 ක් පමණ වූ පිරිමි පුද්ගලයෙකු වන අතර අනන්‍යතාව මෙතෙක් තහවුරුවී නොමැත.**

මෘත ශරීරය පොලොන්නරුව රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති පොලොන්නරුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 05. මාරක රිය අනතුරක් - හෝමාගම පොලිස් වසම.

2025.09.18 වන දින සවස් කාලයේ හෝමාගම පොලිස් වසමේ හයිලෙවල් මාර්ගයේ කැන්දලන්ද ප්‍රදේශයේදී කොළඹ දෙස සිට අවිස්සාවේල්ල දෙසට ධාවනය වූ යතුරුපැදියක් පැදිකරුට පාලනය කරගත නොහැකිව මාර්ගයේ පෙරලීගොස් විරුද්ධ දෙසින් පැමිණි බස් රථයක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් තුවාල ලබූ යතුරුපැදිකරු හෝමාගම රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 48 ක් වූ හෝමාගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය හෝමාගම රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර හෝමාගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 06. මාරක රිය අනතුරක් - වංකාල පොලිස් වසම.

2025.09.18 වන දින සවස් කාලයේ වංකාල පොලිස් වසමේ මන්නාරම වංකාල මාර්ගයේ එන්.එස්.බී හංදිය අසලදී මන්නාරම දෙස සිට වංකාල දෙසට ධාවනය වූ යතුරුපැදියක් එම දිසාවටම ධාවනය වූ පාපැදියක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් තුවාල ලබූ යතුරුපැදිකරු, පසුපැදිකරු හා පාපැදිකරු ප්‍රතිකාර සඳහා මන්නාරම රෝහලට ඇතුලත් කිරීමෙන් පසු පාපැදිකරු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 70 ක් වූ වංකාල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය මන්නාරම රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර වංකාල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 07. මාරක රිය අනතුරක් - අනුරාධපුර පොලිස් වසම.

2025.09.18 වන දින රාත්‍රී කාලයේ අනුරාධපුර පොලිස් වසමේ අනුරාධපුර ප්‍රධාන වීදියේ නව බස්නැවතුම්පල අසලදී දහයියාගම හන්දිය දෙස සිට ඩී.එස්. වටරවුම දෙසට ධාවනය වූ කාර් රථයක් දකුණු පසට හැරවීමට යාමේදී මාර්ගයේ සිටි පදික පුද්ගලයෙකුගේ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් තුවාල ලබූ පදික පුද්ගලයා ප්‍රතිකාර සඳහා අනුරාධපුර රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මියගොස් ඇත.

**මරණකරුගේ අනන්‍යතාව මෙතෙක් තහවුරුවී නොමැත.**

මෘත ශරීරය අනුරාධපුර රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර අනතුර සිදුකල කාර් රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. අනුරාධපුර පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 08. මාරක රිය අනතුරක් - කොස්ගොඩ පොලිස් වසම.

2025.09.18 වන දින සවස් කාලයේ කොස්ගොඩ පොලිස් වසමේ යාල්ගම කයිකාවල මාර්ගයේ ගෝනගල හන්දියේදී කයිකාවල දෙසට ධාවනය වූ යතුරු පැදියක් අතුරු මාර්ගයකට හැරවීමට යාමේදී එම දිසාවටම ධාවනය වූ ත්‍රීරෝද රථයක් යතුරුපැදියේ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් යතුරුපැදිකරු හා පසුපැදිකාරිය තුවාල ලබා ප්‍රතිකාර සඳහා බලපිටිය රෝහලට ඇතුලත් කිරීමෙන් පසු පසුපැදිකාරිය මියගොස් ඇත.

**මරණකාරිය වයස අවුරුදු 66 ක් වූ ගල්තුඩුව ප්‍රදේශයේ පදිංචිකාරියෙකි.**

මෘත ශරීරය බලපිටිය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර ත්‍රීරෝද රථ රියදුරු අත්අඩංගුවට ගෙන පොලිස් ආරක්ෂාව යටතේ බෙන්තර රෝහලේ ප්‍රතිකාර ලබයි. කොස්ගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 09. මාරක රිය අනතුරක් - කිලිනොච්චිය පොලිස් වසම.

2025.09.18 වන දින රාත්‍රී කාලයේ කිලිනොච්චිය පොලිස් වසමේ උරුත්තිපුරම් මාර්ගයේ 08 ඇල ප්‍රදේශයේදී අරවියර් නගර් දෙස සිට උරුත්තිපුරම් දෙසට ධාවනය වූ බස් රථයකින් මගියෙකු ඇද වැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් තුවාල ලැබූ මගී පුද්ගලයා කිලිනොච්චිය රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 26 ක් වූ උරිත්තිපුරම් ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය කිලිනොච්චිය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. ඇඟළුම් ආයතනයක සේවකයින් පිරිසක් ප්‍රවාහනය කරමින් සිටි බස් රථයකින් ඇද වැටී මෙම අනතුර සිදුව ඇති අතර බස් රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. කිලිනොච්චිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 10. මාරක රිය අනතුරක් - අක්මීමණ පොලිස් වසම.

2025.09.18 වන දින සවස් කාලයේ අක්මීමණ පොලිස් වසමේ පින්නදූව දක්ෂිණ අධිවේගී පිවිසුම් මාර්ගයේදී ගාල්ල දෙස සිට පැමිණි යතුරු පැදියක් පිටමුල්දෙනිය අතුරු මාර්ගයට හැරවීමට යාමේදී එම දිසාවටම ධාවනය වූ තවත් යතුරුපැදියක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් තුවාල ලැබූ යතුරුපැදිකරුවන් දෙදෙනා ප්‍රතිකාර සඳහා කරාපිටිය රෝහලට ඇතුලත් කිරීමෙන් පසු එක් පැදිකරුවෙකු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 69 ක් වූ යක්ගහ, වලහන්දූව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය කරාපිටිය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අක්මීමණ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**